සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

№ 013060

2025-01

| ශ්‍රේණිය / தரம் / Grade | 09 | විෂයය / பாடம் / Subject | පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | කාලය / காலம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ..................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..................

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. පියගුණ වරුණ ගීතයකි.

(1) දුනුකෙයියා මලක් වගේ (2) අම්මා සඳකි
(3) කඳුළු හෙලා නැඹිලියට (4) දෙවැනි බුදුන් ලෙස

02. **ස රි ග , රි ග ප , . . .** භූපාලි රාගයට අදාලව මෙම ස්වර අභ්‍යාසයේ ඊලඟ පියවර වන්නේ,

(1) ප ධ සं (2) ග ප ම (3) ග ප ධ (4) ප ධ නි

03. වාදී සංවාදී හැරුණු විට රාගයක ඉතිරි ස්වර හඳුන්වන්නේ,

(1) අනුවාදී ලෙසය. (2) විවාදී ලෙසය (3) සංවාදී ලෙසය (4) වාදී ලෙසය.

04. හින්දුස්තානි සංගීතයේ ථාය (මේල) පද්ධතියේ නිර්මාතෘ ලෙස සැලකෙන්නේ,

(1) පණ්ඩිත් රවි ශංකර් ය.
(2) උස්තාද් සබීර් හුසේන් ය.
(3) පණ්ඩිත් විෂ්ණු නාරායන් භාත්ඛණ්ඩේ ය.
(4) අමීර් කුෂ්රු ය.

05. ආරෝහණයේ ස්වර **5 ක්** සහ අවරෝහණයේ ස්වර **7 ක්** යෙදේ නම් එහි ජාතිය වන්නේ,

(1) ඖඩව - ෂාඩව (2) ෂාඩව - සම්පූර්ණ
(3) ඖඩව - ඖඩව (4) ඖඩව - සම්පූර්ණ

06. **9** වන මාත්‍රාව මත බලි ස්ථානය පිහිටන තාලය කුමක්ද?

(1) දාදරා (2) කෙහෙර්වා (3) ජප් (4) ත්‍රිතාල්

07. **EADGBE** වශයෙන් තත් සුසර කරනු ලබන සංගීත භාණ්ඩයකි.

(1) ගිටාරය (2) සිතාරය (3) මැන්ඩලීනය (4)ඩබල් බේස්

08. ශ්‍රී ලාංකේය කණ්ඩායම් සංගීතයේ නිර්මාතෘවරයා වන්නේ,

(1) ඇනස්ලි මාලේවන (2) ක්ලැරන්ස් විජේවර්ධන
(3) නෙවිල් ප්‍රනාන්දු (4) බ්‍රයන් රණසිංහ

09. බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණය අනුව භාණ්ඩ වර්ග,

(1) 3කි. (2) 4කි (3) 5කි (4) 6කි.



10. ඉහත සඳහන් විරාම ලකුණ ( Rest Mark ) හඳුන්වන්නේ ,

(1) Semibreve Rest (2) Minim Rest (3) Crotchet Rest (4) Quaver Rest

- **පහත සඳහන් තොරතුරු පාදක කරගනිමින් අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**A. මහනුවර යුගයේ කවිකාර මඩුවේ ගායනා කරන ලද ගීත විශේෂයක් ලෙස ප්‍රශස්ති හා හටන් ගී හැඳින්විය හැකිය.**

**B. " දෑතට වළළු ගීතය " සී ද එස් කුලතිලක මහතාගේ විශිෂ්ට නිර්මාණයකි.**

**C. "ප්‍රේමතෝ ජායතී සෝකෝ" ගීත නාටකයකි.**

**D. " සිරි සඟ බෝධි මාලිගාවේදී " ගීතය සඳහා තනු නිර්මාණය කරන ලද්දේ විශ්වනාත් ලෞජි මහතා විසිනි.**

**E. හේවිසි වාදනය සඳහා තම්මැට්ටම හා දවුල යොදා ගනී.**

11. එදිරිවීර සරච්චන්ද්‍ර ශූරීන්ගේ නිර්මාණයකි.

(1) A (2) B (3) C (4) D

12. සේ ගී ගණයට අයත් ගී ඇතුළත් වරණය වන්නේ,

(1) A (2) B (3) C (4) D

13. විතත සහ විතතාතත ගණයට අයත් වාදන භාණ්ඩ ඇතුළත් වරණය වන්නේ,

(1) A (2) B (3) C (4) D

14. හින්දුස්ථානි සංගීතය පාදක කොට නිර්මාණය වූ නාට්‍ය විශේෂය ඇතුළත් වරණය වන්නේ,

(1) A (2) B (3) C (4) D

15. නෙළුම් ගී පාදක කොටගෙන නිර්මාණය වූ සරල ගීතයකි.

(1) A (2) B (3) C (4) D

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා හිස්තැන් වලට නිවැරදි පිළිතුරු සපයන්න.**

16. භූපාලි රාගයේ....................... ස්වර වර්ජිත වේ.

17. ඉන්දීය ගසල් ගායනයේ ප්‍රධාන ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක් ලෙස .............................. යොදා ගනී.

18. **F Major Scale** එක වාදනය කිරීමේදී ....................... ස්වරය විකෘති ස්වරයක් ලෙස යෙදේ.

19. "රැක් අත්තන මල මුදුනේ" ගීතය නිර්මාණය වී ඇත්තේ ............................ වන්නමේ නාදමාලාව ඇසුරෙනි.

20. සංගීතයේ දී උපයෝගීවන , ශබ්දය ග්‍රහණය කරගන්නා උපකරණය .................................. යි.

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01.

**A.** / ස̇ ස̇ ධ ප / ග රි ස රි / ග - ප ග / ධ ප ග -/
**B.** / ග ප ධ නි / ස̇ - ධ ප / ම ග ම රි / ස රි ස -/
**C.** / ස ස රි රි / ගු ගු ම ම / ප - - ම /ප ධ නි ස̇/

i. ඉහත සඳහන් සර්ගම් ගී පාද හඳුනාගනිමින් රාග නම් කරන්න. (ලකුණු 1 ×3 =3යි.)
ii. ඉන් ඔබ කැමති රාගයක මධ්‍ය ලය ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 4යි.)
iii. ඉහත ඔබ තෝරා නොගත් රාග දෙකෙන් එක් රාගයකට අයත් ආරෝහණ , අවරෝහණ වාදී , සංවාදී ස්වර ලියා දක්වන්න. (ලකුණු 4යි.)

02.

**සිතාරය** **ට්‍රම්පට්**
**ගිටාරය** **සෙලෆෝන්**
**හොරණෑව**
**තබ්ලාව** **බේස්ඩ්‍රම්**
**ගැටබෙරය**

i. ඉහත සඳහන් සංගීත භාණ්ඩ පෙරදිග හා අපරදිග වශයෙන් වෙන් කොට දක්වන්න. (ලකුණු 1/2 ×8 =4යි.)
ii. " **මොර හිඹුටු දං පනා** " මෙම ගීතය ගැයෙන දේශීය තිත හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 2යි.)
iii. එම දේශීය තිතට ගැලපෙන හින්දුස්ථානී තාලය නම් කර නියමිත තාල සංඥා සහිතව ප්‍රස්ථාර කරන්න. (ලකුණු 4යි.)

03.

**A.** **මල්බර හිමිදිරියේ**
**B.** **තරුණ ජීවිතේ අපේ විනෝදයෙන්**
**C.** **මැණිකේ ඔබේ සිනාවේ**
**D.** **හෝයියා හෝයියා**

- **ඉහත සඳහන් වන්නේ ලොස් කැබලරොස් සහ ලාසිලනියන්ස් යන සංගීත කණ්ඩායම් දෙක** ගායනා කරන ලද ගීත කිහිපයක මුල් පාද වේ.

i. එම සංගීත කණ්ඩායම් දෙකට අයත් ගීත වෙන්කොට දක්වන්න. (ලකුණු 1 ×4 =4යි.)
ii. ඔබ දන්නා කණ්ඩායම් ගීතයක ස්ථායි කොටස ලියා දක්වන්න. (ලකුණු 4යි.)
iii. පසු කාලීනව කණ්ඩායම් සංගීතය මඟින් ජනප්‍රිය වූ " **වාග්ගේයකාර** " යන නමින් හැඳින්වූ ගායකයා නම් කරන්න. (ලකුණු 2යි.)

04.

/+ ස රි ග / - ම ග රි / සරි ගම ප -/ග - - - /

i. ඉහත සඳහන් ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයට පෙරලා නැවත ලියන්න. (ලකුණු 4යි.)

ii. මධ්‍යම භාවයෙන් ලියන ලද ස්වර ප්‍රස්තාරය අපරදිග ක්‍රමයට ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 6යි.)

05. පහත සඳහන් මාතෘකා අතරින් පහක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න
( එක් මාතෘකාවට කරුණු දෙක බැගින් සෑහේ )

1. ජාතිය
2. වන්නම්
3. ඵාට
4. සර්පිනාව
5. නූර්ති
6. එකෝඩියනය

(ලකුණු 2×5 = 10යි.)